www.xtrapapers.com

Cambridge O Level

**Cambridge International Examinations**
Cambridge Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2016**

**1 hour 30 minutes**

INSERT

**READ THESE INSTRUCTIONS FIRST**

This Insert contains the reading passage for use with the Question Paper.

You may annotate this Insert and use the blank spaces for planning.
This Insert is **not** assessed by the Examiner.

This document consists of **2** printed pages.

DC (ST) 122300/1
© UCLES 2016

CAMBRIDGE
International Examinations

www.xtrapapers.com



Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–12** on the Question Paper.

විවාහයෙන් පසු ඉක්මණින් ම නව යුවල මහා නගරයේ පදිංචියට ගියහ. මහා නගරයේ දී රැකියා ලබා ගැනීම ඉතා පහසු බව ඔවුන්ගේ මිතුරන් හා නෑදෑයින් කියා තිබුණි. ගමේ දී ඔවුන් දෙනොට ම රැකියාවක් ලබා ගැනීම සඳහා ඉතා වෙහෙස මහන්සි වීමට සිදු විය. නගරයට ගොස් ටික දිනකින් ම ඔවුන් දෙනොට ම රැකියා ලැබුණි. ඔහුට වඩු කාර්මිකයකු ලෙස රැකියාවක් ලැබුණ අතර ඇය එක් පවුලක කුඩා ළමයින් දෙදෙනා බලා ගැනීම සඳහා බඳවා ගන්නා ලදී. වසර දෙකකට පසුව එම යුවළට ඔවුන්ගේ පළමු වැනි දරුවා ලැබුණි. බොහෝ දේවල් ඔවුන් දෙදෙනාට හොඳින් සිදු වූ නමුත් ඔවුන් ආශාවෙන් බලා සිටි එක් දෙයක් වූයේ ප්‍රාදේශීය සභාවෙන් සාදවමින් තිබූ අඩු වියදම් නිවාසවලින් එකක් ඔවුන්ටත් ලැබේය යන්නයි. මේ අලුත් නිවාස කුඩා වුවත් ඒවා ඔවුන්ගේ ආදායම අනුව ගෙවිය හැකි මට්ටමේ ඒවා විය. අඩු ආදායම් සහිත රැකියාවල නිරත වූ නගරයේ බොහෝ දෙනාට තමන්ගේ පළමු නිවස හිමි කරගැනීමේ එකම මාර්ගය වූයේ එම නිවාසයි. ඔවුන්ගේ පළමුවැනි දරුවා ලැබෙන්නට මාස කීපයකට පෙර පොරොත්තු ලැයිස්තුවේ ඔවුන්ගේ නම් උඩින් ම තිබෙන බව ඔවුන්ට දන්වන ලදි. එහෙත් ඒ ලියුම ඔවුන්ට වැරදීමකින් එවන ලද්දක් බව පසුව දන්වන ලදී.

සුලු වශයෙන් මුදල් ඉතිරි කරගනිමින් ඔවුන් ජීවිතය ගෙන ගියේ එම මුදලින් පළමුවැනි දරුවාගේ හා ඉන් තවත් අවුරුදු තුනකට පසුව ඉපදුණු දෙවැනි දරුවාගේ ළමා පාසැල්වලට ගෙවීම සඳහාය. ඒ දරුවන් තවත් ටිකක් වැඩුණාට පසුව ඔවුන්ගේ පාසැල් සඳහා වියදම් කිරීමටත් ඔවුන්ට මුදල් අවශ්‍ය විය. තම දරුවන් පාසැල් වසර පුරාම මහන්සි වී ඉගෙන ගැනීම කෙරෙහි ඔව්හු උනන්දු වූහ. පසුව ඔවුන්ගේ ළමයින් උසස් විදුහල්වලට ඇතුළු වූ අතර එහි දී ද මහන්සියෙන් ඉගෙන ගෙන ඔව්හු විශ්ව විද්‍යාලවලට ද ගියහ. නගරයට තව තවත් ජනයා පැමිණීමත් සමග ම පොරොත්තු ලැයිස්තුවල නම් ඇතුළත් කර ගැනීම තව තවත් අමාරු වූ හෙයින් තමන්ට වඩා දුෂ්කරතා තිබූ වෙනත් බොහෝ පිරිස් සිටි බවත් ඔවුන්ගේ අවශ්‍යතා තමන්ට වඩා හදිසි බවත් එම යුවල දැනගත්හ. දරුවන් බොහෝ ගණනක් සිටි පවුල් ද, රෝගී හෝ තුවාල සහිත දෙමාපියන් සිටි, එමෙන්ම ඔවුන් මුලින් නගරයට පැමිණි කාලයේ මෙන් පහසුවෙන් රැකියා සොයාගත නොහැකි වු පවුල් ද ඒ අතර වූ බව ඔව්හු දැනගත්හ.

නගරයට පැමිණි දා සිට කුළියට ගෙන තිබූ කාමර දෙකකින් යුත් කුඩා (එපාට්මන්ට්) නිවාසයේ එම පවුලේ අය අවුරුදු විස්සක් ම ජීවත් වූහ. ඔවුන්ගේ දෙවැනි දරුවා විශ්වවිද්‍යාලයට ඇතුළු වී මාස දෙකකට පසුව ලිපිගොනු හා වෙනත් ලිපි ලේඛන රාශියක් රැගෙන රජයේ නිලධාරියෙක් ඔවුන් බැලීමට පැමිණියේය. ඔවුන් සඳහා නිවසක් වෙන්කර තිබෙන බවත්, ඔවුන් තවමත් ඒ ගැන උනන්දුවක් දක්වන්නේ නම් එම ලේඛනවල අත්සන් කරන ලෙසත් ඔහු කියා සිටියේය. එවිට ඊළඟ සතියේ ඔවුන්ට එම නිවසේ යතුරු භාර ගත හැකිවනු ඇත.

ලේඛන අත්සන් කළ ඔව්හු එම අලුත් නිවසේ පදිංචියට ගියහ. ජීවිතයේ පළමු වරට දැන් තමන්ගේ ම කියා නිවසක් ඔවුන්ට හිමි වී ඇත. ඔවුන්ගේ පැරණි කුඩා නිවසේ මෙන් එහි ද නිදා ගැනීමට හා කෑම කෑමට තැන් තිබුණි. ඒ හැර එහි සාලයක් ද කුඩා ගෙවත්තක් ද තිබුණි. ඉන් අවුරුදු කීපයකට පසුව, ඒ යුවලගේ දරුවන් සාර්ථක රැකියාවන් ලබාගත් අතර, ඔවුන්ට ම අයත් වඩා විශාල නිවාස ද හිමි කරගත්හ. එහෙත් ඔවුහු නගරයේ ම නැවතී සිටියහ.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge International Examinations Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cie.org.uk after the live examination series.

Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.

© UCLES 2016